# ගැඩවිල් පොහොර හා දියර තාක්ෂණය

කොම්පෝස්ට් නිෂ්පාදනය හා පංශු කළමනාකරණය සඳහා පස මතුපිට හා පහළ ස්ථරවල ජීවත් වන ගැඩවිලුන් යොද ගැනීමේ තාක්ෂණය ගැඩවිල් තාක්ෂණය නමින් හැඳින් වේ.

පසේ ජීවත්වන ගැඩවිලුන් සාමාන්‍යයෙන් කොටස් 3 ක් යටතේ වර්ගීකරණය කරනු ලබයි

1. **එපිජික්ස් (Epigeics)**

පස මතුපිට ජීවත් වන, ප්‍රධාන වශයෙන් කුණු කසළ හා අනෙක් ජීවීන්ගේ අපද්‍රව්‍ය ආශ්‍රිතව ජීවත් වන ඒවා ආහාරයට ගන්නා ගැඩවිලුන් මේ යටතට අයත් ය.

කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියේ දී මොවුන් බහුල වශයෙන් යොද ගැනේ.

2. **ඇනිසික්ස් (Anecics)**

පස තුළ පසේ ස්ථරවල ජීවත් වන ගැඩවිලුන් මේ යටතට අයත් ය. මොවුන් පස තුළ සිරස් අතට දිවෙන කුහර සාදනු ලැබේ. කුණු කසල සත්ත්ව අපද්‍රව්‍ය හා කාබනික ද්‍රව්‍යවලින් පොහොසත් පස් මත මොවුන් යැපේ. කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලියට මෙන්ම පාංශු ව්‍යුහය වැඩි දියුණු කිරීම සඳහා විශේෂයෙන්ම පසේ වාතනය වැඩි දියුණු කිරීම සඳහා මොවුන් විශාල මෙහෙයක් ඉටු කරනු ලබයි.

3. **එන්ඩොජික්ස් (Endogeics)**

මොවුන් බහුලවම පස තුළ හරස් අවකාශ සාදනු ලබන අතර කාබනික ද්‍රව්‍ය බහුල පස් මත ජීවත් වේ. මොවුන් පස නිර්මාණයට දයක වේ.

ගැඩවිලුන් යොද ගනිමින් පොහොර නිෂ්පාදනය කරන්නේ නම් ඔවුන් සඳහා අඛණ්ඩව ආහාර සැපයීම කළ යුතුය. ඒ සඳහා ගොවිපලවලින් ඉවතලන අපද්‍රව්‍ය, මුළුතැන් ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය හා නයිට්‍රජන්වලින් පොහොසත් ද්‍රව්‍ය වන ගොම සහ එළුබෙටි යොදගත හැක. නමුත් කුකුළු පොහොර භාවිතා කිරීමේ දී ප්‍රවේශම් විය යුත්තේ එහි විෂ ද්‍රව්‍ය අඩංගු බැවිනි.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා තම ගෙවත්තෙහි හෝ නිවසේ ඇති ද්‍රව්‍යමය භාවිතා කළ හැක. බෝග අවශේෂ, ආපන ශාලාවලින් ඉවතලන ද්‍රව්‍ය වුවද භාවිතා කළ හැක. කෙසේ වෙතත් යොදන ලද ද්‍රව්‍යයෙහි නයිට්‍රජන් ප්‍රමාණය අඩුනම් ඒවාට නයිට්‍රජන් ප්‍රභවයක් එකතු කිරීම අවශ්‍යයි. ඒ සඳහා ග්ලිරිසීඩියා හෝ මුරුංගා කොළ හෝ ගව මුත්‍ර එකතු කළ හැකිය.

මෙලෙස අපද්‍රව්‍ය පොහොර නිපදවීම සඳහා භාවිතා කිරීමෙන් කාබනික ඝන අපද්‍රව්‍ය ප්‍රශ්නයෙන් මිදීමටත් අපට පිළිවන. ඒ අනුව ගැඩවිල් පොහොර නිෂ්පාදනය කාබනික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමක්ද වෙයි

**ගැඩවිලුන් මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන ආකාරය**

මේ සඳහා කොන්ක්‍රීට් ටැංකි, සිලින්ඩර, ලී හෝ ප්ලාස්ටික් බඳුන් යනාදිය යොද ගැනීමට පිළිවන. එහි දී සැලකිය යුතු කරුණු කීපයක් නම් ස්ථානය සෙවණ සහිත විය යුතු වීම හා භූමිය මත ජලය රඳා නොපැවතිය යුතු වීමයි. ඒ අනුව තෙත් කලාපීය ප්‍රදේශ සඳහා වලවල් සෑදීම අනුමත නොකරන්නේ වැසි ජලය එක්රැස් වීමෙන් ගැඩවිලුන් විනාශ වී යන බැවිනි.

**පියවරයන්**

- පළමුව කුඩා කැබලිවලට කඩාගත් ගඩොල් කැට සෙන්ටිමීටර 3 - 4 ක් උසට සිටින සේ භාජනය පතුලෙහි අතුරන්න. ගඩොල් කැට කැබලි වෙනුවට බොරළු වුවද යොදගත හැකිය.
- එය මතුපිට නැවතත් සෙන්ටිමීටර 3 - 4ක් උසට වැලි තට්ටුවක් අතුරන්න. මෙසේ කරනුයේ ජලය එක්රැස් වීම වැළැක්වීමටයි.
- වැලි තට්ටුවට උඩින් සෙන්ටිමීටර 15 ක ඝනකමින් යුතුව තෙත ලොම් පස් තට්ටුවක් දැමිය යුතුය. එය තුළට අවට පරිසරයෙන් සොයාගනු ලැබූ ගැඩවිලුන් 100 ක් පමණ ඇතුළත් කළ යුතුය. (පස මතුපිට ස්ථරයේ ජීවත් වන අය 50 ක් හා පහළ ස්ථරයේ ජීවත් වන අය 50 ක් වශයෙන්) අනතුරුව ගැඩවිලුන්ගේ ආහාරය පිණිස වියළි ගොම කුඩා කැබලිවලට කඩා ඉහළින්ම අතුරළා මද වශයෙන් තෙත් කරන්න. අමු ගොම නම් කුඩා ගුලි සාද තැනින් තැන තබන්න.
- ඉන් පසුව සෙන්ටි මීටර 10 ක ඝනකමින් යුතු පිදුරු තට්ටුවකින් ආවරණය කරන්න.
- සියලු ස්ථර හොඳින් තෙත්වන පරිදි ජලය එකතු කළ යුතුය. තෙත බරිත නොවීමට වගබලා ගත යුතුය. ජලය වැඩි වුවහොත් ගැඩවිලුන් මිය යන අතර අඩු වුවහෝ ඔවුන් වෙනත් ස්ථානයකට ගමන් කරනු ඇත.
- දැන් මෙම පද්ධතිය පොල් අතුවලින් හෝ පරණ ගෝනියකින් ආවරණය කළ යුතුය. ප්ලාස්ටික් ද්‍රව්‍ය මේ සඳහා නුසුදුසු වන්නේ ඒවා මගින් තාපය හා වායූන් පද්ධතිය මත එක්රැස් වීමට ඉඩ ඇති බැවිනි.
- දැන් මෙම පද්ධතියට දින 30 ත් යන තුරු ජලය එකතු කරමින් නඩත්තු කළ යුතුය. දින 30 අවසාන වන විට ගැඩවිල් පැටවුන් දැකගත හැකියි. 31 වැනි දිනයේ සිට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමට පටන් ගත හැකිය. පොල් අතු ඉවත් කර සෙන්ටිමීටර 5 ක ඝනකමින් යුතු තට්ටුවක් ලෙස ඒවා ඇතිරීම කළ යුතුය. කාබනික ද්‍රව්‍ය එකතු කිරීම දිනපතා කළ හැකි වුවද පළමු වතාවට කරන්නේ නම් සතියට දෙවතාවක් එකතු කිරීම අනුමත කෙරේ. මෙසේ කිහිප වතාවක් කාබනික ද්‍රව්‍ය එකතු කළ පසු වැලි පස් තට්ටුවලට හානි නොවන පරිදි මිශ්‍රණය කලවම් කිරීම කළ යුතුය. මෙසේ කිරීමෙන් දින 45 ක දී කාබනික ද්‍රව්‍යවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය කරගත හැකිය.
- යොදනු ලැබූ කාබනික ද්‍රව්‍ය මෘදු, සිනිඳු ප්‍රියමනාප සුවඳකින් යුතු තද දුඹුරු පැහැති වූ විට ජලය යෙදීම නැවැත්විය යුතුය. එවිට ගැඩවිලුන් පොහොර ස්ථරයේ සිට පස් තට්ටුව කරා ගමන් කරයි. දැන් කොම්පෝස්ට් ඉවතට ගෙන හොඳින් හිරු එළිය ඇති සමතලා බිමක කේතුවක ආකාරයට ගොඩගසා තබන්න. හිරු එළිය නිසා ගැඩවිලුන් කොම්පෝස්ට්වලින්

ඉවතට ගමන් කරයි. මේ සඳහා දින 2 - 3 ත් අතර කාලයක් ගත වේ. ඉන්පසු අවශ්‍ය නම් පොහොර සල්ලඩයකින් හලා පොලිතින් බෑග්වල අසුරා ගන්න.

**විශාල පරිමාණයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කරන්නේ නම්,**

මෙම ක්‍රමයට නාගරික ඝන අපද්‍රව්‍ය, කෘෂිකාර්මික අවශේෂ වැනි ද්‍රව්‍ය භාවිතා කරමින් විශාල පරිමාණයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කරන්නේ නම් ඒවා ඊට පෙර අර්ධ වශයෙන්ජීර්ණයකට භාජනය කළ යුතුය. ඒ සඳහ එම ද්‍රව්‍යවලට ගොම දියර මිශ්‍ර කොට සියයට 60 ක් දක්වා ජලය කලවම් කර දින 15 - 20 ක් යනතුරු පොලොව මත ගොඩ ගසා තබන්න. නිතර කලවම් කිරීම කළ යුතුය. අවශ්‍ය නම් ජලය එකතු කිරීම කළ යුතුය. මෙවිට උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 60 ක් දක්වා ඉහළ යන අතර රෝගකාරක විෂබීජ හා වල්පැල බීජ විනාශ වීමට එය හේතු වේ.

එසේ නැතහොත් කාබනික ද්‍රව්‍ය හා ගොම දියර තට්ටු වශයෙන් ස්ථර කිහිපයකට තැන්පත් කිරීම කළ හැකිය. කාබනික ද්‍රව්‍යවලට ශාක පත්‍ර එකතු කළ හැකි නම් වඩාත් යෝග්‍යය. පහළින් වාතය හොඳින් ලැබීම තහවුරු වීමට ශාක දඬු තට්ටුවක් මත ඇසිරීම කළ යුතුය. ශාක දඬු තට්ටුවේ පළල මීටර 1.5 කට වැඩි නොවිය යුතු අතර අවශ්‍ය තරම් දිගක් පවත්වා ගත හැකිය. ඇසුරුම් උස ද මීටර 1.5 කට වැඩි නොවිය යුතුය. උෂ්ණත්වය ඉහළ ගොස් ජීර්ණය වේගවත් වීමට මෙම පද්ධතිය කළු පොලිතින්වලින් ආවරණය කළ යුතුය. දෙතුන් වතාවක් කලවම් කළ යුතුයි. දින 20 - 25 ක් ගත වූ පසු මිශ්‍රණය මඳ වශයෙන් දිරූ ස්වභාවය් ගන්නා අතර සිසිල් කිරීමෙන් පසු ගැඩවිලුන් මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකි ය.

**බෝග සඳහා අනුමත පොහොර ප්‍රමාණයන් වනුයේ,**

- බඳුන්ගත බෝග සඳහා - බඳුනකට ග්‍රෑම් 100
- එළිමහන් ශාක සඳහා - ශාකයේ වයස අනුව කිලෝග්‍රෑම් 1 - 10 ත් අතර
- වී වැනි බෝග සඳහා - අක්කරයට කිලෝග්‍රෑම් 2000 - 3000 පමණ

**ගාඩවිල් දියර පොහොර**

ශාක වර්ධනය සඳහා වර්තමානයේ දියර පොහොර වර්ග බහුලව බාවිතා වන අතර ඉහළ මිල ගණන් යටතේ විවිධ දියර පොහොර වර්ග වෙළෙඳපල තුළ දක්නට ලැබේ. නමුත් ගැඩවිලුන් යොදා ගනිමින් අඩු වියදමකින් යුතුව ඉහළ ගුණාත්මයෙන් යුතුව දියර පොහොර නිපදවා ගත හැකිය.

ගැඩවිලුන් ජීවත්වන පස තුළ ඔවුන් විසින් කුහර සාදන අතර ඒවා තුළින් ජලයේ දිය වූ පාංශු පෝෂක ශාක මුල් කරා ගමන් කිරීම සිදු වෙයි. මෙම සිද්ධාන්තය ගැඩවිල් දියර පොහොර නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කෙරේ.

**ගැඩවිල් දියර පොහොර නිෂ්පාදන ඒකකයක් සාද ගන්නේ කෙසේ ද?**

මේ සඳහා බැරල්, ලොකු බාල්දි හෝ මැටි කලයක් යොද ගත හැකි ය. බැරලයක් භාවිතා කරන්නේ නම්,

- එහි එක් පියනක් ඉවත් කළ යුතු ය. භාජනයේ පතුලට අඟලක් පමණ උසින් සිදුරක් විද කරාමයක් සවි කළ යුතු ය. ඒ දියර පොහොර එකතු කර ගැනීම සඳහා ය.
- බැරලය තැබිය යුත්තේ පොළොව මට්ටමින් අඩි 1.5 ක පමණ උසින් ය. ඒ සඳහා ගඩොල් කැට කීපයක් භාවිතා කළ හැකි ය.
- පළමුවෙන් ම සෙන්ටිමීටර 25 ක ඝනකමට අඟලක පමණ විශාලත්වයට කඩාගත් ගඩොල් කැට කැබලි හෝ ගල් කැට තට්ටුවක් අතුරන්න.
- ඉන්පසු නැවතත් සෙන්ටිමීටර 25 ක ඝනකමට රළු වැලි තට්ටුවක් අතුරන්න.
- කරාමය හැර මේ තට්ටු දෙක මතින් ජලය ගමන් කිරීමට සලස්වන්න. මේ තට්ටු දෙක පද්ධතියේ පෙරණය ලෙස ක්‍රියා කරයි.
- මෙයට උඩින් සෙන්ටිමීටර 30 - 45 ක ඝනකමට හොඳ ලොම් පස් තට්ටුවක් අතුරන්න. ජලය එකතු කර තෙත් කිරීමෙන් පසු ගැඩවිලුන් 100 ක් පමණ එය තුළට දමන්න.
- අනතුරුව ගැඩවිලුන් ගේ ආහාරය පීස වියළි ගොම කුඩා කැබලිවලට කඩා ඉහළින් ම අතුරා මද වශයෙන් තෙත් කරන්න. අමු ගොම නම් කුඩා ගුලි සාද තැනින් තැන තබන්න. එළුබෙටි නම් ඒ ආකාරයෙන් ම තැනින් තැන තබන්න.
- ඉහළින්ම වියළි තෘණ හෝ පිදුරු තට්ටුවක් අතුරන්න.
- වැඩිපුර ඇති ජලය ඉවත්ව ගිය පසු කරාමය වසා දමන්න.
- දින 10 - 14 ගතවන තුරු දිනපතා ජලය එකතු කළ යුතුය. මෙම කාලය තුළ දී ගැඩවිලුන් සංඛ්‍යාව වැඩිවීම හා පස තුළ කුහර සෑදීම සිදුවන අතර තෘණ හෝ පිදුරු තට්ටුව දිරාපත්ව තිබෙනු නිරීක්ෂණය කළ හැකි ය.
- 15 වැනි දිනයේ දී කරාමය වසා දමා සිදුරු කිහිපයක් සහිත මැටි හෝ ලෝහ භාජනයක් බැරලය උඩින් එල්ලා එහි ජලය ලීටර 2 ක් පමණ පුරවන්න. (එකතු කළ යුතු ජලය ප්‍රමාණය බැරලයේ ධාරිතාව මත වෙනස් වේ) සිදුරුවලට පහන්තිර සම්බන්ධ කිරීමෙන් ජලය බිංදු වශයෙන් වැටීමට සැලැස්විය හැකිය. මෙසේ එකතු වන ජලය කුහර තුළින් ගමන් කර බැරලයේ පතුලේ රැඳී පවතී. ඊළඟ දිනයේ දියර පොහොර ලෙස ඒවා එකතු කර ගත හැකි ය. සිදුරු සහිත භාජනයට නැවත නැවත ජලය එකතු කිරීමෙන් නැවත නැවත දියර පොහොර ලබාගත හැකි ය. ලෝම පස් තට්ටුව වසරකට වරක් අලුත් කළ යුතු ය.

**ගැඩවිල් දියර පොහොර නිෂ්පාදන ඒකකයක් ලෙස මැටි කළයක් භාවිතා කරන්නේ නම්,**

එහි පතුලේ තනා ගන්නා සිදුරකට ඝන කපු රෙදිවලින් තනා ගන්නා ඇබයක් සවි කිරීමෙන් එය කරාමයක් ලෙ භාවිතා කළ හැකි ය.

**යොදන ආකාරය**

- හිරු බැසගිය පසු සවස් කාලයේ ස්ප්‍රේ යන්ත්‍රයක් භාවිතයෙන් යොදන්න. යෙදීමට පෙර 1:7 අනුපාතයට ජලය සමඟ මිශ්‍ර කර ගත යුතු ය. කොළ එළවළු වර්ග සඳහා වඩාත් ඵලදායකය.
- එසේම 10% ගව මූත්‍ර සමඟ මිශ්‍ර කර කාබනික කෘමිනාශකයක් ලෙසත් භාවිතා කළ හැක.


-06-21
DATE OF STUFFED 2011-06-
-30 cm
-24 cm
-24 cm





ලංකා කාබනික කෘෂිකර්ම ව්‍යාපාරය (LOAM) විසින් විද්‍යාත්මක පර්යේෂණ හා අත්දැකීම් පාදක කොට ගෙන මෙය සකස් කොට ඇත

L O A M

**Lanka Organic Agriculture Movement**

**ලංකා කාබනික කෘෂිකාර්මික ව්‍යාපාරය**

**இலங்கை சேதன விவசாய இயக்கம்**